# ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම

## හැඳින්වීම

- පෘතුග්‍රීසින් හා ලන්දේසින් ආසියාවේ වෙළඳ කටයුතුවලින් විශාල ලාභ ලබන බව දුටු ඉංග්‍රීසින් ද ආසියාවේ කෙරෙහි තම අවධානය යොමු කළහ. ඉංග්‍රීසි ව්‍යාපාරිකයන් ක්‍රි.ව 1600 දෙසැම්බර් මස ඉංග්‍රීසි පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම පිහිටවූ අතර එම වෙළඳ සමාගමේ පළමුවන නැව් කණ්ඩායම සුමාත්‍රා දූපත්වලට ගොස් එහි වෙළඳ කටයුතු ආරම්භ කළහ. පසුව විලියම් හෝකින්ස් යටතේ තවත් නැව් කණ්ඩායමක් ඉන්දියාවට පැමිණ මූගල් අධිරාජ්‍යයා වූ ජහන්ගීර් සමඟ වෙළඳ කටයුතු පිළිබඳ සාකච්ඡා පැවැත්විය.

- 17 වන සියවසේ මුල් දශක 02 තුළ අග්නිදිග ආසියාවේ වෙළඳ බලය ගොඩනගා ගැනීමට පෘතුග්‍රීසින් හා ලන්දේසින් අතර ගැටුම් ඇතිවිය. මෙහිදී ඉංග්‍රීසින් ලන්දේසින්ට උදව් කළේය. නමුත් ඉංග්‍රීසින් වෙළඳ කටයුතුවලට ඇතුල්වනු දැකීමට ලන්දේසින් අකමැති විය. මේ නිසා 1623 දී කුළුබඩු දිවයින්වලට අයත් ඇම්බොයිනා දූපතේ බලකොටුවකට පහරදුන් ලන්දේසින් එහි සිටි ඉංග්‍රීසින් ඝාතනය කලහ. ඉන් පසුව ඉංග්‍රීසින්ගේ අවධානය ඉන්දියාව කරා යොමුවිය. 17 වන සියවසේ අග කාලයේදී මදුරාසිය, බොම්බාය, කල්කටා ඇතුළු ප්‍රදේශවල වෙළඳ මධ්‍යස්ථාන ආරම්භ කිරීමට ඉංග්‍රීසින් සමත් විය.




"කෑගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ සමාජ විද්‍යා අංශය"

# ශ්‍රී ලංකාව කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමුවීම

## බලපෑ ප්‍රධාන හේතු

### 01) ශ්‍රී ලංකාවේ පිහිටීම

- ශ්‍රී ලංකාව ඉන්දියාව ආසන්නයේ පිහිටීම හා ඉන්දියන් සාගරයේ නැව් මාර්ගයේ මධ්‍යගතව පිහිටීම්
- ඉන්දියාවේ බටහිර හා නැගෙනහිර වෙරළේ නාවික කටයුතු ලංකාවේ සිට මෙහෙයවීම.
- ත්‍රිකුණාමල වරාය බෙංගාල බොක්කට මුහුණලා පිහිටීම.
- ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ ඉංග්‍රීසි නාවික බලය රැකගැනීම.
- ඊසාන දිග මෝසම් කාලයේ නැව් ආරක්ෂා කරගැනීමට ත්‍රිකුණාමල වරාය වැදගත්වීම.
- ත්‍රිකුණාමලය වරාය ස්වභාවික වරායක් වීම.

### 02) ශ්‍රී ලංකාවේ කුරුඳු ඇතුළු වටිනා වෙළඳ ද්‍රව්‍ය ලබාගත හැකිවීම

- ශ්‍රී ලංකාවේ කුරුඳුවලට ප්‍රමුඛස්ථානයක් හිමිවීම.
- පෙරදිග රටවල් සමඟ කළ වෙළඳාමෙන් පෘතුග්‍රීසින්ට හා ලන්දේසින්ට විශාල ආදායම් ලැබීම.
- ගම්මිරිස්, මුතු මැණික් හා ඇත්දළ ආදි වටිනා වෙළඳ ද්‍රව්‍ය ලබාගත හැකිවීම.





ත්‍රිකුණාමල වරාය






වෙළඳ ද්‍රව්‍ය

## ඉංග්‍රීසින් හා උඩරට රාජ්‍ය අතර දූත සබඳතා

- 1762 දී ජෝන් ෆයිබස් උඩරට කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමුවීම.
- 1782 දී හියු බොයිඩ් රාජාධිරාජසිංහ රජු හමුවීම.
- 1795 දී රොබට් ඇන්ඩෲස් රාජාධිරාජසිංහ රජු හමුවීම.

## බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම

- ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත්කර ගැනීමේදී දැකිය හැකි ලක්ෂණ 03 කි.
- 1796 දී ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම දිවයිනේ මුහුදුබඩ ප්‍රදේශවල බලය පිහිටුවීම.
- 1802 දී පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම යටතේ පාලනය වූ මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් වීම.
- 1815 දී උඩරට රාජධානිය ඉංග්‍රීසින් යටත් කරගැනීම.


# 1797 වර්ෂයේ ඉංග්‍රීසි වෙළඳ සමාගමට එරෙහිව ඇති වූ කැරැල්ල

- පෙරදිග ඉන්දිය වෙළඳ සමාගම ගෙනගිය මදුරාසි පාලනය ජනතාවට පීඩාකාරී වූ හෙයින් 1797 දී මුහුදුබඩ ප්‍රදේශවල කැරැල්ලක් ඇතිවිය.
- මුහුදුබඩ ප්‍රදේශවල වූ ගැටුම්කාරී තත්ත්වය සොයාබලා ප්‍රතිසංස්කරණය කිරීමට බ්‍රිගේඩියර් ජෙනරාල් ඩී මියුරන්ගේ සභාපතිත්වයෙන් කොමිසමක් පත් කළහ. එය මියුරන් කොමිසම නම් විය.

**මියුරන් කොමිසමේ නිර්දේශ :**

- බදු එකතු කිරීමට යොදවා සිටි මදුරාසි නිළධාරීන් වෙනුවට දේශීය නිළධාරීන් පත් කිරීම.
- පොල්ගස් බද්ද ඇතුළු අලුත් බදු වර්ග ඉවත් කිරීම.
- මුදලින් බදු ගෙවීම වෙනුවට භාණ්ඩ වලින් බදුවර්ග එකතු කිරීම.
- ආදායම් එකතු කිරීමට හා අධිකරණ කටයුතු සඳහා වෙනම නිළධාරීන් පත් කිරීම.
- ලන්දේසි උසාවි ක්‍රමය නැවත පිහිටුවීම.

# බ්‍රිතාන්‍යයන්ට උඩරට රාජධානිය යටත් කරගැනීමට හේතු



- මුහුදුබඩ ප්‍රදේශයේ ආරක්ෂාව පතා වෙරළබඩ හා උඩරට රාජ්‍ය සීමාවේ හමුදා 02ක් නඩත්තු කිරීමට සිදුවීම හා මුහුදුබඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව සිදු කෙරෙන කැරලි වලදි උඩරට රජු ඔවුන්ට උදව් දීම.
- මුහුදුබඩ ප්‍රදේශවල ජනතාව උඩරට රජු තමාගේ රජු ලෙස පිලිගැනීම.
- කොළඹ හා ත්‍රිකුණාමලය අතර මුහුදු සබඳතා වලදි විශාල මුදලක් වැය කිරීමට සිදුවීම.
- කොළඹ හා ත්‍රිකුණාමලය දක්වා උඩරට හරහා මහාමාර්ගයක් තැනීමට අවසර ඉල්ලුව ද එය ප්‍රතික්ෂේප වීම.

## 1803 ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයාගේ ආක්‍රමණය

- මැක්ඩෝවල්ගේ දූතගමන අසාර්ථක වීම නිසා නෝර්ත් ආණ්ඩුකාරවරයා 1803 දී උඩරට ආක්‍රමණය කරන ලදී.

## 1803 උඩරට ආක්‍රමණයේ බ්‍රිතාන්‍යයන් පරාජයවීමට හේතු

- උඩරට ස්වාධීනත්වය
- සිංහලයන්ගේ ගරිල්ලා සටන් ක්‍රම
- සිංහලයන්ගේ එකමුතුකම
- ජනතාව රජුට පක්ෂපාතී වීම
- හමුදාව මෙහෙයවීම දුෂ්කර වීම
- වර්ෂාකාලය ඇතිවීමත් සමඟ ගංවතුර ගැලීම



# 1815 උඩරට ගිවිසුම

- 1815 මාර්තු 02 දින මහනුවර රාජසභා ගොඩනැගිල්ලේ දී රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා හා උඩරට වැසියන් වෙනුවෙන් රදළ ප්‍රධානින් අතර උඩරට රාජධානිය යටත්වීම සම්බන්ධව ගිවිසුමක් ඇතිවිය. එය **උඩරට ගිවිසුමයි.**



# විදේශ ආධිපත්‍යයට එරෙහි වූ සටන්

## 01. 1818 නිදහස් සටන (ඌව වෙල්ලස්ස සටන)

1817 සැප්තැම්බර් සිට 1818 ඔක්තොම්බර් දක්වා උඩරට ප්‍රදේශවල පැවති ඉංග්‍රීසි ආණ්ඩු විරෝධි ආයුධ සන්නද්ධ නැගිසිටීම 1818 නිදහස් සටන නම් විය.





# 1818 නිදහස් සටනට බලපෑ හේතු

- ජනතාවට නිදහස අහිමිවීම හා රජෙකු නැතිවීම පිළිබඳ පසුතැවිල්ල.
- උඩරට ප්‍රභූ පංතියට පහර වැදීම.
- ආගම හා සංස්කෘතියේ ආරක්ෂාව පිළිබඳ ගැටළු මතුවීම.

**1818 නිදහස් සටන**

**ව්‍යාප්ත වූ ප්‍රදේශ**

- ✓ දුම්බර
- ✓ හේවාහැට
- ✓ හාරිස්පත්තුව
- ✓ මාතලේ
- ✓ සපරගමුව
- ✓ නුවරකලාපිය



**සටනේ නායකයෝ**

- ✓ කැප්පෙටිපොළ දිසාව
- ✓ කොහුකුඹුරේ රටේරාල
- ✓ මඩුගල්ලේ දිසාව
- ✓ පිළිමතලාවේ දිසාව
- ✓ බූටෑවේ රටේරාල
- ✓ කිවුලේගෙදර මොහොට්ටාල
- ✓ දඹවින්න දිසාව
- ✓ දිඹුලාන දිසාව
- ✓ ගලගෙදර මොහොට්ටාල

# 1818 නිදහස් සටනේ ප්‍රතිඵල

- ඉංග්‍රීසි ආණ්ඩුවේ දරුණු මර්ධනයට උඩරැටියන් ඉලක්ක වීම.
- කැප්පෙටිපොල හා මඩුගල්ලේ රාජද්‍රෝහීන් ලෙස සලකා බෝගම්බරදී හිසගසා මරණයට පත් කිරීම.
- අනෙකුත් නායකයින් රටින් පිටුවහල් කිරීම, දේපළ රාජසන්තක කිරීම.
- ඉංග්‍රීසින්ට පක්ෂපාතී වූ මොල්ලිගොඩ හා එක්නැලිගොඩට වරප්‍රසාද හා නිලතල හිමිවීම.

# 02. 1848 දෙවන නිදහස් සටන

## ➢ සටනට බලපෑ ආසන්නතම හේතුව

1833 ක්‍රියාත්මක කළ කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල බලපෑම හා ටොරින්ටන් ආණ්ඩුකාරවරයා 1848 දී නව බදු වර්ග පැනවීම්

**එසේ පැනවූ නව බදු වර්ග :**

- ✓ මුද්දර බද්ද
- ✓ කරත්ත හා ඔරුපාරු බද්ද
- ✓ වෙළඳසැල් බද්ද
- ✓ තුවක්කු බද්ද
- ✓ ඇඟ බද්ද
- ✓ බලු බද්ද

# 1848 නිදහස් සටන

## ව්‍යාප්ත වූ ප්‍රදේශ

- ✓ මාතලේ (ප්‍රධාන මධ්‍යස්ථානය)
- ✓ මහනුවර
- ✓ කුරුණෑගල
- ✓ වාරියපොල

## සටනේ නායකයෝ

- ✓ වීර පුරන් අප්පු
- ✓ ගොංගාලේ ගොඩබංඩා
- ✓ හඟුරන්කෙත ඩිංගිරාල
- ✓ දියෙස්
- ✓ කඩහපොළ හිමි





# ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම

1. ඉංග්‍රීසි ව්‍යාපාරිකයින් විසින් පිහිටුවන ලද වෙළඳ සමාගම කුමක් ද?
2. විලියම් හෝකින්ස් ඇතුළු නැව් කණ්ඩායම ඉන්දියාවට පැමිණෙන විට එහි සිටි මුගල් අධිරාජයා කවුරුන් ද?
3. ඉංග්‍රීසින්ගේ පෙරදිග වෙළඳ මධ්‍යස්ථාන මොනවාද ?
4. ප්‍රංශවරුන් පිහිටුවාගත් වෙළඳ මධ්‍යස්ථාන මොනවා ද?
5. අග්නිදිග ආසියාවේ වෙළඳ බලය ලබා ගැනීමට ගැටුම් ඇති වූ ජාතීන් 2 ක් දක්වන්න.
6. ඉංග්‍රීසිහු මෙරටට අවධානය යොමු කිරීමට බලපෑ ප්‍රධාන හේතු දෙක මොනවා ද?
7. ත්‍රිකුණාමල වරාය කෙරෙහි ඉංග්‍රීසින්ගේ අවධානය යොමුවීමට හේතු මොනවා ද?
8. බෙංගාල බොක්කට මුහුණලා පිහිටා තිබූ මෙරට වරාය කුමක් ද?
9. මෙරටින් ලන්දේසින් පලවා හැරීමට කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා දූතයන් යවන ලද්දේ කිනම් ජාතීන් වෙත ද?

10. උඩරටට පැමිණි ඉංග්‍රීසි දූතයන් හා ඔවුන් පැමිණි වර්ෂයන් දක්වන්න.

11. ජෝන් පයිබස් මෙරටට පැමිණෙන විට උඩරට පාලකයා වශයෙන් කටයුතු කරන ලද්දේ කවුරුන්ද ?

12. ඉංග්‍රීසින් මෙරට මුහුදුබඩ ප්‍රදේශවල බලය තහවුරු කරගත් වර්ෂය කුමක් ද?

13. මෙරට මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත්වූ වර්ෂය කුමක් ද?

14. ක්‍රි.ව 1795 වර්ෂය වනවිට මෙරට මුහුදුබඩ ප්‍රදේශ පාලනය කල ලන්දේසි ආණ්ඩුකාරයා සඳහන් කරන්න.

15. ලන්දේසින් සතුව තිබී ඉතා කෙටි කාලයකදී ඉංග්‍රීසින් අතට පත්වූ ශ්‍රී ලංකාවේ වරායන් මොනවා ද?

16. ඉංග්‍රීසින් විසින් මෙරට මුහුදුබඩ පලාත්වලට හඳුන්වා දුන් නව බදු වර්ග මොනවා ද?

17. ඉංග්‍රීසි වෙළඳ සමාගමට විරුද්ධව මුහුදුබඩ ප්‍රදේශවල කැරැල්ල ඇති වූ වර්ෂය කුමක් ද?

18. මුහුදුබඩ ප්‍රදේශවල ඇති වූ කැරැල්ල සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය ප්‍රතිසංස්කරණ නිර්දේශ කිරීමට පැමිණි කොමිසම කුමන නමින් හැඳින්වේ ද?

19. මියුරන් කොමිසමේ නිර්දේශ මොනවා ද?

20. මෙරට මුහුදුබඩ ප්‍රදේශවල පාලනය සඳහා පැමිණි ප්‍රථම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා නම් කරන්න.

21. ද්විත්ව පාලනය හඳුන්වාදුන් වර්ෂය කුමක් ද?

22. ක්‍රිව 1800 වර්ෂයේදී ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා උඩරට රාජධානිය වෙත යැවූ දූත කණ්ඩායමේ නායකත්වය දැරුවේ කවුරුන් ද?

23. ඉංග්‍රීසින්ගේ මෙරට ප්‍රධාන පාලන මධ්‍යස්ථානය කුමක් ද?

24. ඉංග්‍රීසින්ගේ මෙරට ප්‍රධාන නාවික මධ්‍යස්ථානය කුමක් ද?

25. මැක්ඩෝවල් සෙනෙවියාගේ ප්‍රධානත්වයෙන් ඉංග්‍රීසින් උඩරට ආක්‍රමණය කල වර්ෂය කුමක් ද?

26. ක්‍රිව 1803 උඩරට ආක්‍රමණයේදී ඉංග්‍රීසින් මුහුණදුන් දුෂ්කරතා මොනවා ද?

27. කන්නසාමි කුමරු ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් රජකමට පත්වූයේ කුමන අධිකාරම්ගේ මෙහෙයවීම මත ද?

28. නෝර්ත් ආණ්ඩුකාරවරයාගෙන් පසු මෙරට පාලන ධුරය සඳහා පැමිණි ආණ්ඩුකාරවරයා නම් කරන්න.

29. තෝමස් මෙට්ලන්ඩ් උඩරට රාජ්‍ය අනාගතයේදී ආක්‍රමණය කිරීම සඳහා උපායශීලීව කටයුතු කිරීමට යොදාගත් සිවිල් නිලධාරියා නම් කරන්න.

30. ජෝන් ඩොයිලි සිංහල භාෂාව ඉගෙන ගත්තේ කවුරුන් යටතේ ද?

31. උඩරට රාජධානිය පිළිබඳව රහසිගත තොරතුරු ලබා ගැනීමට ඉංග්‍රීසින් යොදාගත් පිරිස් නම් කරන්න.

32. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු මරණීය දණ්ඩනයට ලක්කල මහා අධිකාරම් නම් කරන්න.

33. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අවසන් වසර කිහිපය තුල ගනු ලැබූ යහපත් පියවර කිහිපයක් සඳහන් කරන්න.

34. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු හා උඩරට ජනතාව අතර දුරස්ථභාවය ඇතිවීමට බලපෑ සිදුවීම කුමක් ද?

35. උඩරට ගිවිසුම අත්සන් කල වර්ෂය ස්ථානය හා දිනය නම් කරන්න.

36. උඩරට ගිවිසුමේ මුල් වගන්ති තුනෙන් සඳහන් වන්නේ කුමක් ද?

37. උඩරට ගිවිසුමේ 4 වන වගන්තියේ සඳහන් වන්නේ කුමක් ද?

38. 1818 වර්ෂයේ නිදහස් සටන යනු කුමක් ද?

39. 1818 සටන ඇතිවීමට බලපෑ හේතු මොනවා ද?

40. ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ රදළ ප්‍රධානීන් බලවත් කලකිරීමට පත් සිදුවීම කුමක් ද?

41. ඉංග්‍රීසි පාලනය කෙරෙහි උඩරැටියන් තුල අප්‍රසාදයක් පවතින අතරතුර සිංහාසනයට උරුමයක් ඇතැයි කියමින් වෙල්ලස්ස ප්‍රදේශයෙන් මතු වූ තැනැත්තා කවුරුන් ද?

42. ප්‍රධාන රදළ නායකයින් අතරින් උඩරට සටනට එකතු නොවූ රදළ නායකයින් සඳහන් කරන්න.

43. බිම් පාළු ප්‍රතිපත්තිය යනු කුමක් ද?

44. 1818 නිදහස් සටනට නායකත්වය දුන් පුද්ගලයින් නම් කරන්න.

**Roye *Advertising***

**Moronthota.**

**077 – 689 43 62 / 077 5200 972**